## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය - 2017

-----------------------------------------------------------------------------

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 20 දරන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ පනතේ 28 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව 2018 මැයි 30 දින ආයතනයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-------------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

**(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

----------------------------------------

ප්‍රමිතයේ 51 වන ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.22,397,384 ක්වූ මෝටර් රථ 17 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද ඒවා තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18**

---------------------------------------

ප්‍රමිතයේ 13 වන ඡේදය ප්‍රකාරව අවසන් ගිණුම් ප්‍රකාශනයන්හි ගිණුම් ශේෂ වෙන් වෙන්ව දැක්වීම වෙනුවට පිළිවෙලින් රු.7,757 ක් හා රු.41,904,480 ක්වූ කෘෂිකාර්මික උපකරණ රක්ෂණය හා තෙවන පාර්ශව රක්ෂණ ආදායම කෘෂි උපකරණ රක්ෂණය යටතේ එකතුව රු.41,912,237 ක් ලෙස පෙන්වා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

---------------------------------------

ප්‍රමිතයේ 59 ඡේදය ප්‍රකාරව වර්තමාන හොඳම ඇස්තමේන්තුව හඳුනා ගැනීමට සත්‍ය ගොවි දායකයින් පිළිබඳව ආයුගණක තක්සේරුවක් කිරීමෙන් තොරව ගොවීන්ගේ මරණ පාරිතෝෂික අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.21,175,440 ක ප්‍රතිපාදනයක් සලසා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2014 වර්ෂයේ දී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත පවරන ලද රජයේ වටිනාකම තක්සේරු කර ගිණුම් වලට ගෙන නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 5 ත් වසර 26 අතර කාලයක සිට පැවත එන එකතුව රු.676,194 ක් වූ සේවක ණය සහ අත්තිකාරම් සේවක පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් කාලීනව අයකර ගැනීමකින් තොරව ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) වසර 5 ත් වසර 13 අතර කාලයක සිට ඉදිරියට එමින් පැවතුණු එකතුව රු.708,347 ක ලැබිය යුතු ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

(ඇ) ගොවි හා ධීවර විශ්‍රාම යෝජනා ක්‍රම වලට පරිපාලන වියදම් දැරීම සඳහා පෙර වර්ෂවලදී ලබා දී තිබුණු එකතුව රු. 124,340,973 ක් අයකර ගැනීමකින් තොරව අඛණ්ඩව ඉදිරියට ගෙනඑමින් පැවතුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 2 ත් වර්ෂ 14 ත් අතර කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණු එකතුව රු.1,925,074 ක් වූ ගෙවිය යුතු විගණන ගාස්තු ගෙවීමට සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදි නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 6.3 උප වගන්තිය | 2002 වර්ෂයේ වැඩ තහනම් කරනු ලැබූ නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් චෝදනා පත්‍රයක් නිකුත් කර නොතිබුණි. |
| (ආ) 2010 මාර්තු 30 දිනැති අංක DMS/34(ii) දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ක්ෂේත්‍ර රාජකාරිවල නිරත වන ආයතනයේ විධායක නිලධාරීන් සඳහා 2009 වර්ෂයේ සිට දිනකට රු.2500 බැගින් යැපීම් දීමනා ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව නිල වාහන හිමිකම් නොමැති මධ්‍යම මට්ටමේ කළමනාකාරවරුන් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් කාර්යාල ස්ථානයේ සිට යාමට සහ ඒමට කිලෝමීටර් 100 ක උපරිමයකට යටත්ව සැපයීම කළ යුතු වුවද ප්‍රවාහන දීමනාවට හිමිකමක් නොමැති, අංශ ප්‍රධානියෙකු හා විධායක නිලධාරියෙකු වෙනුවෙන් පිළිවෙලින් මාසයකට රු.8,000 ක් හා රු.4,000 ක් ද බැගින් එකතුව රු.1,948,000 ක් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 තුළ දී ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රතිඵලය රු.49,930,208 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.355,825,300 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.305,895,092 ක එනම් සියයට 86 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීම සඳහා ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී වී වගා රක්ෂණ ආදායම් ලැබීම් රු.580,565,015 කින් අඩු වීම ද කෙතට අරුණ වන්දි ගෙවීම් හැර වී වගා හා වන්දි ගෙවීම් රු.198,433,350 කින් වැඩි වීමද හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී ඌනතාවයක් පැවතියද 2014 වර්ෂයේදී නැවත අතිරික්තයක් බවට පත්වී 2017 වර්ෂය දක්වා උච්චාවචනයන් සහිතව වර්ධනය වී තිබුණි. කෙසේවුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසු 2013 වර්ෂයේදී රු. 20,510,517 ක ඍණ අගයක් වූ ආයතනයේ දායකත්වය 2014, 2015, 2016 හා 2017 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.89,041,275 ක්, රු.93,025,769 ක්, රු.450,004,279 ක් හා රු.145,733,936 ක් වශයෙන් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සියළුම රක්ෂණ ක්‍රම වලින් රු.210,000,000 ක් ඉපයීමට ඉලක්ක කර සිටියද තථ්‍ය ඉපයීම රු.156,474,160 ක් වීමෙන් ආදායම රු.53,525,840 කින් එනම් සියයට 25 කින් අඩු වී තිබුණි.

(ආ) සුවසෙත හා හදිසි අනතුරු රක්ෂණ ක්‍රමයේ ආදායම් ඉපයීමේ ඉලක්කය රු.29,833,000 ක් වුවද එය ඉටු කර ගැනීම රු.5,313,362 ක් වූයෙන් එහි ප්‍රගතිය සියයට 18 කට වඩා අඩු මට්ටමක් විය. මෙය පසුගිය වර්ෂය හා සැසඳීමේදී සියයට 66 ක අඩුවීමකි.

(ඇ) කෘෂි උපකරණ රක්ෂණය සඳහා දිස්ත්‍රික්ක 16 කින් රු.2,343,000 ක ආදායමක් ඉපයීමට සැලසුම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික්ක 7 කින් රු.40,055 ක් පමණක් උපයා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික්ක 05 කින් වී ගබඩා 490 ක් රක්ෂණය කිරීමට අපේක්ෂා කර තිබුණ ද එක් ගබඩාවක් පමණක් රක්ෂණය කර තිබුණි.

(ඉ) වන්දි ලබා ගැනීමේදී ගොවි ජනතාව පත්වන අපහසුතාවය මඟහරවා, ඉතා කෙටි කාලසීමාවක් තුළ හානි තක්සේරු කර අදාල වන්දි මුදල් ලබා දීම සඳහා දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමයක් දිස්ත්‍රික්ක 5 ක ක්‍රියාත්මක කිරීමට මණ්ඩලය ලෝක බැංකුවට අනුබද්ධිත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ 2016 මැයි 05 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. අදාළ ව්‍යාපෘති කටයුතු 2019 මැයි 04 නිමවීමට නියමිත නමුදු, වාර්තාවේ දින වන විටද වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් මෙය ක්‍රියාත්මක කර තිබුණි.

(ඊ) රතු ළූනු, කුරක්කන්, උඳු, රටකජු, කව්පි, මුං, තල, බුලත්, ගම්මිරිස්, ඉඟුරු, කොකෝවා, තේ, පොල්, එළවළු, පළතුරු, මල් වගා, කජු, උක් හා පුවක් යන රක්ෂණ යෝජනා ක්‍රම සංයුක්ත සැලැස්මේ සඳහන්ව තිබුණ ද ඒවා ක්‍රියාත්මක වී නොතිබුණි.

(උ) ධීවර සහ වන වගා නිෂ්පාදනයට රක්ෂණය ආරම්භ නොකිරීම , තරඟකාරී නව රක්ෂණ ක්‍රම අවශ්‍යතා හඳුනාගෙන ක්‍රියාත්මක නොකිරීම හා වාණිජ බැංකු කෘෂිකාර්මිකයාට ලබාදෙන ණය යෝජනා ක්‍රම අධ්‍යයනය කර වඩා ඵලදායී රක්ෂණ ක්‍රම හඳුන්වා දී ගොවීන් රක්ෂණ ක්‍රමවලට පොළඹවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ඇඹිලිපිටිය දිස්ත්‍රික් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ලබා දී ඇති ඉඩම සඳහා වර්ෂ 31 ක් වෙනුවෙන් රු.2,764,344 ක හිඟ බදු මුදලක් ගෙවිය යුතු බවත් එසේ නොවුවහොත් 2017 මාර්තු 31 දිනෙන් පසුව සියයට 10 ක අධිභාරයක් ද එකතුවන බව මහවැලි අධිකාරිය මගින් මණ්ඩලයට ලිඛිතව දන්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද මේ සඳහා කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) 2005 වසරේ සිට වසර 13 කට ආසන්න කාලයක සිට අනිවාර්යය නිවාඩු යවා තිබූ නිලධාරින් දෙදෙනෙකු සම්බන්ධයෙන් විනය පරීක්ෂණ කටයුතු 2018 ජුනි 30 දින වන විට ද ආරම්භ කර නොතිබුණි.

(ඇ) 2016 / 2017 මහ කන්නයේදී නියඟයෙන් පීඩාවට පත් වූ ගොවි ජනතාවට සහන සැලසීම සඳහා එක් ගොවියෙකුට රු.10,000 බැගින් වන්දි මුදලක් ගෙවීමට රජය තීරණය කර තිබුණි. එම වන්දි මුදලින් රක්ෂණ වාරික වශයෙන් රු.1,350 ක් අඩු කර රු.8,650 බැගින් දිස්ත්‍රික් කාර්යාල විසින් විද්‍යුත් මාධ්‍ය ඔස්සේ එවූ හානි වාර්තා පදනම් කරගෙන අන්තර් බැංකු ගනුදෙනු මගින් (SLIP Transaction) ගෙවීම සිදුකර තිබුණද එම මුල් වාර්තා මණ්ඩලය විසින් නැවත පරික්ෂාවකට ලක් කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i). අතුරු භෝග වගාකර හානි වූ ගොවීන් 32 දෙනෙකුට හිමි රු.276,800 ක මුදලක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව මහජන බැංකු ශාඛාවේ එක් ගොවියෙකුගේ ගිණුමකට බැර වී තිබුණු අතර 2018 ජුනි 30 දින දක්වා එය නිරවුල් කර නොතිබුණි.

(ii). වන්දි ගෙවීම් කරන විට ජාතික හැඳුනුම්පත් අංක ද්විගණනය නොවන ලෙස ගෙවීම් කළ යුතු බව දන්වා තිබුණ ද දිවයිනේ දිස්ත්‍රික්ක 10 ක ගොවීන් 414 දෙනෙකුට එකම හැඳුනුම්පත් අංකය හා එකම නම සඳහන් වීම හේතුවෙන් රු.3,581,100 ක් වැඩිපුර ගෙවා තිබුණ බව විගණන නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii). වන්දි ලාභීන්ගේ හැඳුනුම්පත් අංක , නම වෙනස්වීම නිසා ගොවීන් 9,587 දෙනෙකුට ගෙවූ එකතුව රු.82,927,550 ක මුදලක් බැංකු මඟින් ප්‍රතික්ෂේප වී තිබූ අතර, 2018 ජූනි 30 දින වන විට ඉන් ගොවීන් 6,461 කට අදාළව රු. 57,366,800 ක මුදලක් තව දුරටත් ගෙවිය යුතුව තිබුණි.

(ඈ) ගොවි නියෝජිතයන් වෙත බෙදාහැරීම සඳහා මණ්ඩලයේ මාතර දිස්ත්‍රික් කාර්යාලය වෙත භාරදීමට 2017 මාර්තු 01 දින අධ්‍යක්ෂ (අලෙවි) විසින් රැගෙන ගිය අවම අලෙවි වටිනාකම රු.470,000 ක් වූ රක්ෂණ කාඩ්පත් 1,000 ක්, වටිනාකම රු.31,970 ක් වූ ටී ෂර්ට් 46 ක් හා රථ වාහන අයදුම්පත් 2,000 ක් අස්ථාන ගතවී තිබුණි.

(ඉ) 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගොවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් අය කර ඇති රු.30 බැගින් වූ ගොවි විශ්‍රාම වැටුප් රක්ෂණ වාර මුදල් එකතුව රු.194,619,125 ක් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය වෙත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේදී කළමනාකරණ සහකාර බඳවා ගැනීම් 44 ක් වෙනුවෙන් පුවත්පත් දැන්වීම් පළ කිරීමට රු.137,640 ක් හා දිස්ත්‍රික් මට්ටමින් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට රු.843,298 ක් වැයකර තිබුණ ද 2018 ජූනි 30 දින වන තෙක් කිසිඳු බඳවා ගැනීමක් සිදු කර නොතිබීමෙන් සමස්ථ වියදම වූ රු.980,938 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි.

(උ) 2010 වර්ෂයේ සිටම ආයතනයේ කාර්යසාධනය වර්ධනය කිරීමට පවතින බාධාවන් වශයෙන් පහත සඳහන් දුර්වලතා හඳුනාගෙන තිබුණ ද ඒවා මඟහැර ගැනීමට කළමනාකරණය මෙතෙක් අපොහොසත් වී තිබුණි.

(i). ජීවසණක හා පර්යේෂණ කටයුතු සඳහා විශේෂඥ දැනුමක් ඇති ස්ථිර නිලධාරියෙකු නොමැති වීම.
(ii). නිපුණතාවයක් ඇති කාර්ය මණ්ඩලයේ හැකියාවන් ක්‍රියාත්මක කිරීමට ඇති බාධාවන්.
(iii). නව තාක්ෂණයට අනුව කටයුතු කළ හැකි කාර්යය මණ්ඩලයේ හිඟකම.
(iv). ආයතනය සතුව ඇති ගොඩනැඟිලි ප්‍රමාණවත් නොවීම හා ප්‍රධාන කාර්යාලය සඳහා ස්ථිර කාර්යාලයීය ගොඩනැඟිල්ලක් නොමැති වීම.
(v). තරඟකාරී ආයතන සමඟ සසඳන කල ආයතනය සතු කාර්යාලයීය උපකරණ ඉහළ තාක්ෂණික මට්ටමින් හා අවශ්‍ය කරන ප්‍රමිතීන්ගෙන් යුක්ත නොවීම.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**
**-----------------------------------**

ගොවි නියෝජිතයන් හට බෙදාදීම සඳහා 2017 මැයි මාසයේදී මිලදී ගත් වටිනාකම රු.157,920 ක් වූ ටී ෂර්ට් 282 ක් 2018 ජූනි 30 දින වන විටද බෙදාහැර නොතිබුණි.

**4.4 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය සතුව ධාවනය කළ හැකි සංචිත වාහන 7 ක් පැවතිය ද සේවයේ නියුක්ත රියදුරන් සංඛ්‍යාව තිදෙනෙකු පමණක් වීම හේතුවෙන් එම වාහන ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) වර්ෂ 30 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින ඇඹිලිපිටියේ පිහිටි නිල නිවාසයක් අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කර භාවිතයට ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

**4.5 අනාර්ථික ගනුදෙනු**

**----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වගා භූමියේ හා වගාවේ තොරතුරු ලබා ගැනීමට අමාත්‍යාංශය යටතේ සිටින ක්ෂේත්‍ර නිලධාරින් සඳහා ජංගම තාක්ෂණ උපකරණ 1000 ක් මිලදී ගැනීමට හා වගා හානි වෙනුවෙන් ප්‍රතිරක්ෂකයෙකු තෝරා ගැනීම වෙනුවෙන් ලංසු කැඳවීම සඳහා පුවත්පත් මඟින් දැන්වීම් පළ කිරීමට පිළිවෙලින් රු.115,115 ක් හා රු.32,000 ක් වැය කර තිබුණි. එසේ වුවද එම කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් පුවත්පත් දැන්වීම් සඳහා දරා තිබූ මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ආ) සේවක අර්ථසාධක අරමුදල් සඳහා දායකය ගණනය කිරිමේදී ජීවන වියදම් දීමනාව සැලකිල්ලට නොගැනීම හේතුවෙන් 2006 ජනවාරි සිට 2013 අප්‍රේල් දක්වා සේවකයාගේ හා සේවායාගේ හිඟ දායකය ලෙස රු.29,409,723 ක් හා අධිභාර ලෙස රු.14,704,862 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) මණ්ඩලයට කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ජලය සපයා ගැනීම වෙනුවෙන් 2008 ජුනි 04 දින ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට රු.565,800 ක් ගෙවා තිබුණද මුදල ව්‍යාපෘතිය අත්හැරීම නිසා අනාර්ථික වියදමක් බවට පත් වී තිබුණි. එසේ වුවද එම වටිනාකම ප්‍රාග්ධන අත්තිකාරම් ලෙස ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් දක්වා තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

**-----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තනතුරු නාම 12 ක පැවති පුරප්පාඩු 119 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් සම්පූර්ණ කර නොතිබුණි. තවද 2018 වර්ෂය තුළ නිලධාරින් 09 ක් විශ්‍රාම යාම හා කොන්ත්‍රාත් හා අනියම් පදනමින් නිලධාරින් 49 ක් සේවයේ යොදවා සිටීම ආදිය හේතුවෙන් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ සමස්ථ කාර්යසාධන මට්ටම අවම තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව හා මණ්ඩලයේ අනුමක කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ ව්‍යාපාර සංවර්ධන කළමනාකාර තනතුරු සඳහා නිලධාරින් හතරදෙනෙකු කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තෙවැනි පාර්ශව රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා සේවයේ නියුක්ත කර තිබුණි. භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ඔවුන්ට රු.40,000ක මාසිකව දීමනාවක්, රු.35,000ක වාහන දීමනා, ලීටර් 250 කට සමාන ඉන්ධන දීමනා ලෙස 2015 හා 2016 වර්ෂයන්හිදී එකතුව රු.8,071,022 ක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් නිලධාරීන් දෙදෙනෙකුට පමණක් රු.3,769,660 ක මුදලක් ගෙවා තිබුණි.

## 5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ යෝජනා ක්‍රමය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(අ) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා රක්ෂණය වූ ගොවීන් පිළිබඳව හා වගා බිම් පිළිබඳව නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2017 වර්ෂය දිළිඳුකමින් නිදහස් කිරීමේ වර්ෂය ලෙස හඳුනාගෙන තිබුණු අතර අරමුණ අනුව කෘෂිකාර්මික හා ගොවිජන යෝජනා ක්‍රමය විසින් දරිද්‍රතා මට්ටම උග්‍ර ලෙස පවතින දිස්ත්‍රික්ක ලෙස නම් කර ඇති මන්නාරම, මුලතිව්, කිලිනොච්චි, මඩකලපුව, බදුල්ල හා මොනරාගල දිස්ත්‍රික්ක හරහා ප්‍රචාරක වැඩසටහන් හා ව්‍යාපෘතීන්වලට ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කරන බව දක්වා තිබුණ ද ප්‍රචාරණ වැඩසටහන් වලදී වැඩි ප්‍රමුඛතාවයක් ලබාදී තිබුණේ තෙවන පාර්ශව රක්ෂණ ආදායම් වැඩි කර ගැනීම සඳහා පමණි.

(ඇ) තිරසර සංවර්ධන අරමුණු යටතේ දේශගුණික විපර්යාස හා එහි බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක වීම සඳහා හඳුනාගත් ඉලක්කය ලෙස දර්ශක මත පදනම් වූ රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වා දීම මඟින් වන්දි ගෙවීම කාර්යක්ෂම කිරීමට සැළසුම හඳුනාගෙන තිබුණද, වර්තමානය වනවිටත් එය වවුනියා දිස්ත්‍රික්කයේ පමණක් ක්‍රියාත්මක කර තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 68 ත් සියයට 419 ත් අතර විචලනයක් වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 6.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම

2016 පෙරවාරි 26 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ 13 වැනි රැස්වීම් වාර්තාව අනුව ආයතනයේ නිලධාරින්ට අදාළ තනතුරට හිමි වැටුප් හා දීමනාවලට අමතරව වෙනත් දීමනාවක් ලබා ගැනීමට හිමිකම නොතිබුණ ද, 2017 වර්ෂයේ ධීවර විශ්‍රාම වැටුප් විශේෂ දීමනාව වශයෙන් රු.438,428ක් ද ගොවි විශ්‍රාම වැටුප් විශේෂ දීමනා වශයෙන් රු.812,250 ක්ද රක්ෂණ කොමිස් හා දිරිදීමනා ලෙස රු.11,995,426 ක්ද එම නියෝගයට පටහැනිව ගෙවා තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මානව සම්පත් කළමනාකරණය | පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | වන්දි ගෙවීම් | (i). ප්‍රමාදයකින් තොරව වන්දි ගෙවීමට කටයුතු නොකිරීම.<br>(ii). වන්දි ගෙවීමේදී පුද්ගලයන් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | රක්ෂණය | (i). කන්නය ආරම්භයත් සමඟ රක්ෂණය සඳහා කටයුතු නොකිරීම.<br>(ii). වගා රක්ෂණයට ගොවීන් නැඹුරු කිරීම සඳහා වැඩසටහන් දියත් කිරීමට කටයුතු නොකිරීම |
| (ඈ) | ලැබිය යුතු ගිණුම් | ණය හා අත්තිකාරම් අය කරගැනීමට කටයුතු නොකිරීම. |